www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් පරිපාලනය "පූර්වභංග යුද්" මූලෝපාය යලි පන ගන්වයි

## Bush Administration Renews "Preemptive War" Strategy

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

**2006 මාර්තු 17**

ධවල මන්දිරය විසින් බ්‍රහස්පතින්දා නිකුත් කරන ලද ජාතික ආරක්ෂක මූලෝපාය නමැති වාර්තාව, සතුරන් ලෙස ගැනෙන අයගෙන් එල්ල විය හැකි තර්ජනයන්ට පිලිතුරු ලෙස ''පූර්වභංග'' පියවර ගැනීම සඳහා එක්සත් ජනපදයේ හිතුවක්කාරී අයිතිය යලි සහතික කරයි.

බුෂ් පරිපාලනයේ ''පූර්වභංග යුද්ධය'' පිලිබඳ ධර්මතාව 2002 සැප්තැම්බරයේ දී පලමුවෙන් ම එලිදරව් වූ විට ඒ පිලිබඳව සාමාන්‍ය අදහස වූයේ මෙය එලඹෙන ඉරාක යුද්ධය යුක්තිසහගත කිරීමේ උත්සාහයක් වූ බව ය. එම රට, ලඟ දී ම කෙසේ වෙතත් පේන දුරමානයක දී වත් ඇමරිකාවට සැබෑ තර්ජනයක් එල්ල කල රටක් නො වී ය. ජාත්‍යන්තර නීතිය තුල කිසිදු පදනමක් නොමැති ප්‍රතිපත්තියක් ගෙන එන්නේ ය යි එක්සත් ජනපදයෙන් පිටත දී මෙම ධර්මතාව පුලුල් ලෙස හෙලා දැකීමට භාජන විය.

ජාතික ආරක්ෂක මූලෝපායේ නවතම සංස්කරනය නිකුත් කිරීම මගින් පූර්වභංග ධර්මතාවෙන් බැහැර වීමක් සිදු නොවන බව බුෂ් පරිපාලනය පැහැදිලිව දක්වා තිබේ; එක්සත් ජනපදය විසින් තමන්ට තර්ජනයක් ලෙස සලකනු ලබන්නා වූ ද හුදු තර්ජනයක විභවයක් ඇත්තා වූ ද, "එම රට එලිපිට කිසිදු විරුද්ධවාදී ක්‍රියාවක් නොකලේ වුව ද" ඕනෑ ම රටකට ඕනෑ ම අවස්ථාවක පහර දීම අයිතියක් ලෙස තබා ගෙන සිටී.

''ස්වයං-ආරක්ෂාවේ දිගුකාලීන මූලධර්ම'' ක්‍රියාවට නංවමින් ''සතුරු ප්‍රහාරය ඇති වන වේලාව සහ ස්ථානය පිලිබඳව අවිනිශ්චිතතා පැවතිය ද, එවන් ප්‍රහාරයක් ඇති වීමට පෙර බලය යෙදීම එක්සත් ජනපදය විසින් බැහැර නොකෙරෙන'' බව බුෂ් පරිපාලනය ප්‍රකාශ කරයි.

ලේඛනය මෙසේ ප්‍රකාශ කරයි: "අපගේ විරුද්ධවාදීන්ගේ එවන් සතුරු ක්‍රියා සිදු වීමට පෙර නැවැත්වීමට හෝ වැලැක්වීමට අවශ්‍ය වුව හොත් එක්සත් ජනපදය සිය ස්වයං-ආරක්ෂාව පිලිබඳව වන නො බිඳිය හැකි අයිතිය පාවිච්චි කරමින් පූර්වභංග ප්‍රහාර එල්ල කරනු ඇත.''

බුෂ් පරිපාලනය කිසිදු විටෙක සිය ධර්මතාවේ අතිමූලික නීතිමය විසංවාදය පැහැදිලි නො කරයි: එලිපිට වන විරුද්ධවාදී ක්‍රියා පමනක් නො ව, එක්සත් ජනපදයට විරුද්ධ ප්‍රහාරයක් ආසන්නව හෝ අඩු ම තරමින් නිශ්චිතව සැලසුම් කෙරෙමින් පවතී ය කියා හෝ පැහැදිලි සාක්ෂ්‍යයක් නැති විටක දී වෙනත් රටකට විරුද්ධ මිලිටරි ප්‍රහාරයකට පදනම ලෙස එක්සත් ජනපදය ස්වයං-ආරක්ෂාව ඉදිරිපත් කරන්නේ කෙසේ ද?

සුපුරුදු ලෙස ම ධවල මන්දිරය පූර්වභංග යුද්ධය සුජාත කිරීම පිනිස ජනසංහාරක ආයුධ පිලිබඳ අවතාරය ඔසවා තබයි. "ජනඝාතක අවි ප්‍රහාරයක එලවිපාක ශක්‍ය ලෙසින් ම ව්‍යසනකාරී වන තත්වයක දී එල්ල වන මාරක අන්තරාය මධ්‍යයේ අපට ඔහේ බලා සිටිය නොහැකි ය. පූර්වභංගයේ මූලධර්මය හා තර්කනය මෙය යි. අපගේ ජාතික ආරක්ෂක මූලෝපායේ පූර්වභංගයට තිබූ තැන එලෙස ම පවතිනු ඇත.''

සිව් වසරකට පෙර ඉරාකය ඉලක්ක කර ගෙන මෙම ධර්මතාව එලියට ගනු ලැබින. ලේඛනයට අනුව අද දවසේ පූර්වභංග ප්‍රහාරයේ වඩාත් ආසන්න ඉලක්කය වීමට බොහෝ සෙයින් ඉඩ තිබෙන රට වන ඉරානය එක්සත් ජනපදයේ ප්‍රබලතම සතුරා බවට පත්ව තිබේ.

ඉරානය න්‍යෂ්ටික අවි වර්ධනය කිරීමේ සිය වෑයම සඟවන්නේ යැයි බුෂ් පරිපාලනය දිගින්දිගට ම කියා සිටී. කෙසේ වෙතත් ඔවුහු මෙසේ ද කියති, ''ඇමරිකාවට ඉරානය පිලිබඳව මෙම න්‍යෂ්ටික කාරනාවන්'' ඉක්මවා ගිය ''වඩා පලල් උත්සුකයන් ද පවතී.'' බුෂ් පරිපාලනය ඔවුන්ගේ සුපුරුදු මැසිවිලිසහගත පැමිනිලි දිගින්දිගට ම ඉදිරිපත් කරයි. ''ඉරාන පාලන තන්ත්‍රය ත්‍රස්තවාදයට අනුග්‍රහය දක්වයි; ඊශ්‍රායලයට තර්ජනය කරයි; මැද පෙරදිග සාමයට බාධා කිරීමට මාන බලයි; ඉරාකයේ ප්‍රජාතන්ත්‍රවාදය

අවුල් කරයිඃ හා එරට වැසියන්ගේ නිදහස සඳහා වන ප්‍රාර්ථනාවන් පිලිකෙව් කරයි." ලියවිල්ල මෙසේ ද පවසයි. "න්‍යෂ්ටික ගැටලුව සහ අපගේ අනෙක් උත්සුකයන් අවසාන වසයෙන් විසඳා ලිය හැක්කේ ඉරාන පාලනය මෙම ප්‍රතිපත්ති වෙනස් කිරීමේ මූලෝපායික තීරන ගැනීමෙන් ම පමනි. එනම් සිය දේශපාලන පද්ධතිය විවෘත කිරීම, තම ජනතාවට නිදහස ප්‍රදානය කිරීම යි".

වෙනත් වචනවලින් කියන්නේ නම්, මෙම ඊනියා ඉරාන න්‍යෂ්ටික තර්ජනය හුදු නිමිත්තකි. සත්‍ය කාරනාව වනුයේ පවත්නා ඉරාන ආන්ඩුව ඇමරිකාවේ ගෝලීය මූලෝපායික උවමනාවන්ට මග හරස් කර ගෙන සිටීම ය. බුෂ් පරිපාලනයට අවශ්‍යව තිබෙන්නේ න්‍යෂ්ටික වර්ධනය අත්හිටුවීමක් නො ව විප්ලවයට පෙර පැවති තත්වය යලි ස්ථාපනය කරන, එනම් ෂා රේසා පාලවී පලවා හැරීමට පෙර පැවති ආකාරයේ එක්සත් ජනපද සේවාදායක රාජ්‍යයක තත්වය ඉරානය තුල යලි පිහිටුවනු ලබන රූකඩ ආන්ඩුවක් සඳහා තත්වය සකස් කරන ටෙහෙරාන 'ආන්ඩු මාරුවකි'.

නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ සියලු පුරසාරම්වලට පිටුපසින්, ඇමරිකාවේ මූලෝපායික ඉලක්කය වන්නේ ආධිපත්‍යය හා මූලිකත්වය බව ලියවිල්ලෙන් පැහැදිලි වෙයි. එක්සත් ජනපදයට ගැලපෙන ආකාරයට ලෝකය යලි සකස් වීම අවශ්‍යයෙන් ම සිදු විය යුතු දෙයක් ලෙසට බුෂ් පරිපාලනය සලකයි. අන් සෑම රටක් හා කලාපයක් ම සරලව ම ඔවුන් කියන ආකාරයට කටයුතු කල යුතු ය.

වෙනිසියුලා ජනාධිපති හියුගෝ ශාවේස්ගේ පාලන තන්ත්‍රය සමග අනන්‍ය කර තිබෙන ''නිදහස් වෙලඳ පොල විරෝධී ජනතාවාදයේ මායාකාරී ආයාචනය'' ප්‍රතික්ෂේප කල යුතු බවට ලතින් ඇමරිකානු ජනතාවට අනතුරු අඟවනු ලැබේ. රුසියාවට අනතුරු අඟවනු ලබන්නේ, ඔවුන් තම ''භූගෝලීය තත්වයේ සහ බලයේ'' වාසිය, ''අපට තීරනාත්මකව වැදගත් වන මැද පෙරදිග, දකුනු හා මධ්‍යම ආසියාවේ, නැගෙනහිර ආසියාවේ පලල්'' කලාපවල ඇමරිකානු ආනුභාවයට වල කැපීම සඳහා යොදා ගැනීමට වෑයම් නො කල යුතු බවට ය. ලේඛනයේ වෙනත් පරිච්ඡේදයක, " අප්‍රිකාව වැඩෙන භූ-මූලෝපායික වැදගත්කමක් දරන අතර එය මෙම පරිපාලනයට ඉහල වැදගත්කමක් ඇති දෙයකි," යි පවසයි. එසේ ම අවසානයේ දී ''චීනය'' ඇමරිකාව සමග ගැටුමක් වලක්වා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, ''චීනයේ නායකයන්'' තමන්ට ''පැරනි චින්තනයේ එල්බ ගෙන සිටීමට නොහැකි බව'' වටහා ගත යුතු ය යි ධවල මන්දිරය කියා සිටියි.

ඇමරිකානු ආධිපත්‍යය ස්ථාපනය කිරීම, ''ඉතා ම ප්‍රතිඵලදායී තනි ආර්ථික පද්ධතිය සහ දුප්පත්කමට ඇති හොඳ ම බෙහෙත'' ලෙස ලේඛනයේ විස්තර කර තිබෙන ධනවාදී වෙලඳ පොල ආර්ථිකයේ අබාධිත ජයග්‍රහනය සමග අනන්‍ය කර තිබේ.

මෙය ලියා තිබෙන්නේ, ධනවාදී වෙලඳ පොලේ ලාභ නියාමයන්ට ලෝක ජනගහනය යටත් කර දැමීමේ ඍජු ප්‍රතිඵලයක් වන ජනගහනයේ දරිද්‍රතාව පිලිබඳ ලෝක අනුපාතයන් පෙර නොවූ විරූ මට්ටම්වල පවතින කාලයක ය.

ධවල මන්දිරයෙන් නිකුත් කරන ලද ලියවිල්ල තුල උන්මත්තක බවේ මාත්‍රාවක් තිබේ. මෙය ජීවනෝන්මාදය තරමට ම ප්‍රතිගාමී ද වූ ලෝක-දෘෂ්ටියකට සේවය කිරීම පිනිස යොදා ගන්නා ලද බොරු හා තාර්කික, සාවද්‍ය හේතුවාදයන්ගේ එකතුවකි.

''ඇමරිකාව යුද වැදී සිටී'' යැයි ප්‍රකාශ කරන හැඳින්වීමකින් ජනාධිපති බුෂ් මෙම ලියවිල්ල ආරම්භ කරයි. කෙසේ වෙතත්, ඔහු කර ගෙන යන යුද්ධය කිසි දිනෙක ප්‍රකාශයට පත් නොකල බව පැවසීමට සහ ඔහුගේ පරිපාලනය තම මිලිටරි ක්‍රියාන්විතය යුක්තිසහගත කිරීම සඳහා බලය ලබා ගත් කොන්ග්‍රස් යෝජනාව සපුරා ගත්තේ වංචාවේ හා රැවටිල්ලේ පදනම මත බව පැවසීමට ඔහු අසමත් වෙයි.

ලියවිල්ලෙන් එලි දක්වා ඇති මූලෝපාය වන්නේ "අපගේ ඉතා ම උදාර වගකීම වන ඇමරිකානු ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම" බව පැවසීමට ජනාධිපති බුෂ් පෙරට ගියේ ය.

මෙය නීතිමය කාරනාවක් ලෙස සාවද්‍ය යඃ ජනාධිපති ධුරයේ දිව්රීම තුල ඔහු "ඇමරිකාවේ ව්‍යවස්ථාව සුරැකීම, සහ ආරක්ෂා කිරීම" කල යුතු වේ. මෙය සුලු වැරදීමක් නො වේ. ඕනෑ ම මිලිටරි හෝ ෆැසිස්ට් ඒකාධිපතියෙක් පැකිලීමකින් තොරව තමන්ගේ "ඉතා ම උදාර වගකීම" මහජනතාවගේ ආරක්ෂාව රැක දීම -- නීතිමය බාධාවන්වල ඇඟිලි ගැසීම්වලින් තොරව නම් වඩාත් සතුටුදායක ය -- බවට එකඟ වනු ඇත.

© www.wsws.org